නව නිපැයුම්

# ජීවන වියදම පහත හෙළන අපේම දර උදුන

*පවත්නා තත්වය අනුව ඉහළ යන ඉන්ධන මිල අමරිකානු ඩොලර් 99 කි. එය තවත් ඉහළ යමින් පවතී. ඉන්ධන මතම වන අපේ පැවැත්ම වෙනස්කර දේශීය විකල්පයන් කෙරෙහි නැඹුරුවීමට හැර දැනට අන් මඟක් නැත. ආරම්භයක් වශයෙන් ඉවුම් පිහුම් සඳහා ජීව දහනයන් පාවිච්චි කිරීමෙන් ඒ සඳහා දැවෙන ඛනිජ තෙල් ප්‍රමාණය අඩුවෙයි. එබැවින් මුළුතැන් ගෙයි කාර්යයන් සඳහා ජීව දහනවර්ග පාවිච්චියට අප හුරුවිය යුතු ය.*

සාමාජිකයන් සිව් දෙනකුගෙන් යුත් පවුලක් සඳහා පහත සඳහන් ද්‍රව්‍යවලින් සමන්විත ආහාරවේලක් සඳහා වියදම ද ඇතුළු පිසීමේ විචලනයන් පහක් පහත දැක්වේ.

1. **ගල් තුනේ ලිප** :- වේලක් සැකසීම සඳහා විනාඩි 50 කාලයක් ගතවීම උපකල්පනය කර දර ග්‍රෑම් 1300 තොග දර කි.ග්‍රෑ එකක් සඳහා රු 5.26 සිල්ලරට දර කි.ග්‍රෑම් එකක් රු 10.00

දුම් ආශ්වාස වන නිසා මෙ ක්‍රමය ඉතා අසතුටුදායක යි

2. **භූමිතෙල් භාවිතය**

සිල්ලර මිල ලීටරයක් අද වෙළෙඳ පොළේ රු 70/- පමණ වේ. දිනකට ලීටරයක් අවශ්‍ය වේ. මේ සඳහා අධික සහනාධාරයක් රජය ගෙවයි.

3. **ගෑස් පාවිච්චිය**

දිනකට කි. ග්‍රෑම් 0.45 පමණ අවශ්‍ය වේ. ප්‍රවාහන වියදම ද සමඟ කි.ග්‍රෑම් 13.68 සිලින්ඩරයක් රු 1200 පමණ වේ. ගෑස් සඳහා රජය සහනාධාරයක් සපයන අතර ළඟදීම මිල නැවත වැඩි විය හැකි ය.

4. **විදුලිය පාවිච්චිය** : රජයෙන් විශාල සහනාධාර සපය යි. දිනකට ඒකක 2.25 පමණ වැය වේ.

5. **ග්ලිරිසිඩියා පාවිච්චිය** : දිනකට කි.ග්‍රෑම් 1.95 පමණ වේ. තොග මිල කිලෝ ග්‍රෑමයක් රු 3 පමණ ය. සිල්ලර මිල රු 5/- වේ. (ග්ලිරිසිඩියා කොළ පස් තෙතමනය ආරක්ෂා කිරීමටත් කාබනික, කොම්පෝස්ට් පොහොර නිපැදවීමට සහ එළුවන්ට ආහාර වශයෙන් දීමට ද හැකි ය. සත්වාහාරයක් ලෙස ද භාවිත වේ.

පසේ සාරය නැංවීම සඳහා නයිට්‍රජන් සැපයීම සඳහා ද ග්ලිරිසීඩියා අනර්ඝයි.

**හතර දෙනකුගෙන් යුත් පවුලක ආහාර පිසීම සඳහා වර්ෂයක වියදම සාරාංශය**

| | |
|---|---|
| දර (කි.ග්‍රෑ .1400) රු 10/- බැගින් | රු:14000/- |
| භූමිතෙල් (ලීටර 365) | රු:25550/- |
| ගෑස් (කි.ග්‍රෑම් 164 25 | රු:14400/- |
| විදුලිය (යුනිට් 821) | රු:14597/- |
| ග්ලිරිඩීසියා (කි.ග්‍රෑම් 657) | රු: 3285/- |

ග්ලිරිඩීසියා පාවිච්චියේ දී ආහාර පිසීම පිණිස දර ලිපක් අවශ්‍ය යි. NERD ප්‍රමිතිය සහිත දර ලිපක් රු:2950/- පමණ මිලට ගත හැකි ය. මෙම දර ලිප රු:1000 – 2000 පමණ වියදමින්, ගමේ දී නිෂ්පාදනය කර ගත හැකිය.

**ඉතිරිය**

ග්ලිරිසීඩියා, ඒ සඳහා විශේෂිත දර ලිපක දහනයෙන් වර්ෂයකට එක් පවුලකට රු 10000 – 20000 දක්වා මුදලක් ඉතිරි කර ගත හැකි වේ. බොහෝ පවුල් සඳහා අවශ්‍ය ග්ලිරිසීඩියා එම පවුල් මඟින් ම වවා ගතහැකි අතර එමඟින් දර පාවිච්චිය අවම කිරීමට හෝ සම්පූර්ණයෙන් නැති කිරීමට හැකි ය. මේ ක්‍රමය යටතේ ජාතික ආර්ථිකය සඳහා වාර්ෂිකව රු බිලියන 40 සිට 60 පමණ ඉතිරියක් වේ.

ජීවන වියදම පහත හෙළීමේ මුල් පියවර දර පාවිච්චිය යි.

**දේශපාලනමය අභිමතය**

ඉන්ධන සඳහා දැරීමට වන අධික වියදම අපේ සමාජ හා දේශපාලන ව්‍යුහය කෙරෙහි බලපාන ආකාරය අප සිත් තුළට තවමත් දැනී නැත්තා සේය. අප මෙම විනාශය හඳුනාගෙන ඒ පිළිබඳ වහාම කටයුතු නොකළහොත් අපට නොදැනෙන සේ වර්ධනය වන මහා විනාශයක් අප මත පතිත වනු ඇත. එබැවින් අපේ ජනතාව තමා සතු හැකියාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගෙන ක්‍රියාකාරී චින්තනයක් සඳහා කැපවීම අවශ්‍ය ය. වඩාත් සාර්ථක දර උදුන් නිෂ්පාදනය එවන් එක් ප්‍රයත්නයකි. පාරිභෝගික ඉල්ලුම අනුව එම උදුන් සඳහා වන සැලැස්ම වෙනස් විය හැකි ය. මෙම උදුන් පහළ ආර්ථික මට්ටමේ පාරිභෝගිකයන් සඳහා ඉතා සුදුසු වන අතර ධනවතුන් කැමති පරිදි කිරිගරුඬ ලෑල්ලක වුවද මෙම උදුන්පසකස් කළ හැකිය. ග්ලිරිසිඩියා පාවිච්චියේ ලාභදායී බව පැහැදිලි කරමින් උගත් හා වාණිජ සමාජය ප්‍රමුඛත්වය දිය යුතු අතර, සියලුම දේශපාලන පක්ෂ එකතුව එහි වැදගත්කම මතු කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ හැකි ය. වැවිලි කර්මාන්ත ඇමතිව සිටි ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා කැබිනට් මණ්ඩලය වෙත කරුණු දක්වමින් ග්ලිරිසීඩියා ශ්‍රී ලංකාවේ හතරවන වගාව ලෙස ඉදිරියට ගැනීමට තිරණයක් ගෙන තිබිණි. පළමුවැනි, දෙවැනි, තෙවැනි වගාවන් සේ තේ රබර් සහ පොල් බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දී තිබිණි. ග්ලිරිසීඩියා පිළිබඳ එම කැබිනට් තීරණය ක්‍රියාත්මක කිරීමට කාලයයි මේ.

සෑම ගමක්, නාගරික ප්‍රදේශයක් සඳහා ම කමිටු පිහිටුවමින්, ග්ලිරිසිඩියා , දහනයක් ලෙස යොදා ගැනීමට ජනතාව දැනුවත් කළ යුතුය. සමෘද්ධි සහනාධාර කමිටු මඟින් තමනට අවශ්‍ය ග්ලිරිසිඩියා උදුන් නිපදවා ගැනීමට ජනතාවට උපදෙස් දීමට රජය මඟින් සම්මන්ත්‍රණ සංවිධානය කළ යුතු ය.

**අර්ජුන හුළුගල්ල**